## මොඩියුලයේ නම - පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍යයා හඳුනා ගැනීම

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

1. අරමුණ

- කළමනාකරණ සංකල්පය නිර්වචනය කර ඵලදායී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය හඳුනා ගැනීම.
- ගුරුවරයා පන්ති කාමර ව්‍යවහාර ගුරු සිසු දෙපිරිසට ම ප්‍රිය උපදවන පරිදි භාවිතා කිරීම.
- විවිධ වයස් කණ්ඩයන්ට අයත් ශිෂ්‍යයන්ගේ ගති ලක්ෂණ හඳුනාගැනීම.
- ළමයා හා පරිසරය, ළමා වර්ධනය, අවශ්‍යතා අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රමවේද භාවිතා කිරීම.
- පන්ති කාමරය තුළ සිසුන්ගෙන් මතුවන අභියෝගාත්මක චර්යාමය ගැටලු කළමනාකරණය කිරීම.

2. ඉගෙනුම් ඵල :

1. පන්ති කාමර කළමානාකරණය යන්න කුමක්දැ යි පැහැදිලි ව ප්‍රකාශ කරයි.
2. කළමනාකරණ ක්‍රියාවලියේ පියවරයන් විධිමත් ව පන්ති කාමර කටයුතුවල දී භාවිතා කරයි.
3. පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ කාර්යභාරය කාර්යක්ෂම ව හා ඵලදායී ව ක්‍රියාත්මක කරයි.
4. පන්ති කාමර සිසුන්ගේ මතුවන අභියෝගාත්මක චර්යා ගැටලු අවස්ථානෝචිත පරිදි කලමනාකරණය කරයි.
5. පන්තිකාමරයේදී හමුවන සිසුන් චර්යාමය විවිධතා අනුව හඳුනා ගනී.
6. සිසුන්ගේ විවිධතා වලට ගැලපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස මෙහෙයවයි.

## 3. අන්තර්ගතය

### 3.1. හැඳින්වීම :

කළමනාකරණය මූලිකව ම සමාජ ක්‍රියාවලියක් ලෙස හඳුනා ගත හැකි ය. ගතික සමාජය හැමවිටම වෙනස්වීම්වලට භාජන වන බැවින් සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සීමිත සම්පත් ඵලදායී ව හා කාර්යක්ෂම ව යොදා ගැනීමට සිදු වේ. කළමනාකරණයේ දී සමාජ අරමුණු ඉටු කර ගැනීම සඳහා සැලසුම් කිරීම, සම්පත් සංවිධානය, ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ඇගයීම තුලින් ඵලදායීත්වය කරා මෙහෙයවනු ලැබේ. අධ්‍යාපනයේ වැදගත් කේන්ද්‍රස්ථානය වන පන්ති කාමර ක්‍රියාවලිය සාර්ථක වීමට නම් ගුරුවරුන් පත්ති කාමරය තුළ කළමනාකරණ කුසලතා වර්ධනය කර ගත යුතු ය. ඒ අනුව පන්ති කාමරය තුළ ගුරුවරුන් භාවිතා කළ යුතු කළමනාකරණ කුසලතා හඳුනා ගැනීම වැදගත් ය.

වේගයෙන් වෙනස් වන ලෝකයේ දරුවා හෙට ලෝකයට සූදානම් කිරීමේ දී ගුරුවරයාට ඇති ප්‍රධාන අභියෝගය වන්නේ, නොදන්නා ලෝකයට නොදන්නා දරුවන් (The unknown children for an unknown world) සූදානම් කිරීම යි. අධ්‍යාපනයේ සියලු ම ඉලක්ක කේන්ද්‍ර ගත වන්නේ ළමයාට ය. මේ නිසා ළමයා හඳුනා ගෙන සාර්ථක ඉගෙනුමක් සෑම ළමයාට ම ලබා දීම අපේක්ෂා කෙරේ. සෑම දරුවකු ම අධ්‍යාපනය ලැබීම මානව අයිතිවාසිකමක් ලෙස විශ්වය ම පිළිගත් ධර්මතාවයකි. මේ නිසා ළමයා හඳුනා ගැනීම හා ඒ අනුව පන්ති කාමර කළමනාකරණය කර ගැනීමේ හැකියාව ගුරුවරයාට අතිශයින් වැදගත් වේ.

මෙම මොඩියුලයෙන් පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍ය හඳුනා ගැනීම සඳහා ගුරු භවතුන්ට ප්‍රයෝජනවත් වන මූලික කරුණු රාශියක් සරල ක්‍රියාකාරකම් මඟින් ඉදිරිපත් කෙරේ. පන්ති කාමර කළමනාකරණය යටතේ පන්ති කාමර කළමනාකරණය හඳුනා ගැනීම, කළමනාකරණ ක්‍රියාවලිය පන්ති කාමරයට ගළපා ගැනීම හා ගුරුවරයාගේ කළමනාකාරීත්ව කටයුතු පිළිබඳ දැනුවත් කිරීම හා ක්‍රියාකාරකම් ඇතුළත් ය. එසේ ම ශිෂ්‍යයා හඳුනා ගැනීම යටතේ ශිෂ්‍යයාගේ සංවර්ධනය හඳුනා ගැනීම, ඒ සඳහා භාවිතා කරන උපකරණ හා හඳුනා ගත් සිසුන්ට ගැළපෙන ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු කිරීම පිළිබඳ ක්‍රියාකාරකම් ඉදිරිපත් වේ. මේවා පදනම් කර ගෙන තවදුරටත් ඒ යටතේ ගුරු නිපුණතා සංවර්ධනය කර ගැනීම ගුරු භවතුන්ගෙන් අපේක්ෂා කෙරේ.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සම්බන්ධ වන්න...

**3.2. පැසි සැලැස්ම**

1. පන්ති කාමර කළමනාකරණය

| සැසිය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 1 | පන්තිකාමර කළමනාකරණය | 1.1. පන්තිකාමර කළමනාකරණයෙහි අවශ්‍යතාවය | සිද්ධි දැක්වෙන පත්‍රිකා අමුණුම 1.1 | සිද්ධි අධ්‍යයන (සරල ක්‍රියාකාරකමක්) | |
| | | 1.2. නිර්වචනය කර ගැනීම. | විනිවිදක/නිර්වචන මල්ටිමීඩියා ඇමුණුම 2 | නිර්වචන ගොඩනැගීම | |
| | පන්ති කළමනාකරණ ක්‍රියාවලිය | 1.3. පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය හැඳින්වීම.<br>පන්ති කළමනාකරණ ක්‍රියාලිය -අවස්ථා | රූප පත්‍රිකා කට්ටල ඇමුණුම 1.3.1<br>රූප සටහන හා තොරතුරු ඇමුණුම 1.4 | ක්‍රියාකාරකම රූප ගැලපීම 1.3.2<br>ඉදිරිපත් කිරීම power point ක්‍රියාකාරකම 1-5 | පැය 3 |
| | | 1.4. ගුරු නායකත්ව ස්වභාවයන් (ශෛලීන්) | ජර්නල් වාර්තා කට්ටල ඇමුණුම 1.6 | ජර්නල් අධ්‍යයනය ඉදිරිපත් කිරීම් කණ්ඩායම් සාකච්ඡා | |
| 2 | පන්තිකාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයා | 1.5.පන්ති කළමනාකරණයෙහි ලා ගුරු කාර්යභාරයන් (කීපයක් ඉදිරිපත් කිරීම)<br>1.ලේඛන හා වාර්තා පවත්වාගෙන යාම<br>2.ශිෂ්‍යයා හඳුනාගැනීම<br>3.විනය පවත්වාගැනීම<br>4. භෞතික හා මානව සම්පත් භාවිතා කරයි<br>5.ප්‍රතිකාර්ය ඉගැන්වීම<br>6.ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය<br>7.විෂය සමගාමී කටයුතු<br>8.ප්‍රජා සබඳතා අන්‍යෝන්‍ය | මල්ටි මීඩියා | ඉදිරිපත් කිරීම power point කණ්ඩායම් ක්‍රියාකාරකම් | |
| | | 1.6 අදාළ කාර්යයට පන්තිකාමර ව්‍යවහාරයන් යොදා ගැනීම | ඕමයි කඩදාසි | කණ්ඩායම් ක්‍රියාකාරකම ඇමුණුම 1.7 | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

2. ශිෂ්‍යයා හඳුනා ගැනීම

| සැසිය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 3 | ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම | ළමයා හඳුනා ගත යුත්තේ ඇයි<br>- ළමයා අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් ම සාධකයකි.<br>- ලොවම දී ඇති තැන<br>- ගැලපෙන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැකසීමට<br>- හඳුනා නො ගතහොත් වන අහිතකර තත්වය | තොරතුරු පත්‍රිකාව ඇමුණුම 2.1 | කෙටි සාකච්ඡාවක් | |
| | ශිෂ්‍යයා හඳුනාගැනිම | - ශිෂ්‍යයා හඳුනා ගැනීමට යොමු කිරීම<br>- ළමයා හඳුනා ගැනීමට අදාල මනෝ විද්‍යාත්මක න්‍යායයන්<br>ඒබ්‍රහම් මාෂ්ලෝ, ජීන් පියාජේ, සිග්මන් ෆ්‍රොයිඩ්<br>- ආරය සහ පරිසරයේ බලපෑම | ශිෂ්‍ය චර්යා පැතිකඩ සඳහන් පත්‍රිකා ඇමුණුම 2.2<br>තොරතුරු පත්‍රිකාව 2.4 | චර්යා පැතිකඩ අධ්‍යයන හා ක්‍රියාකාරකම් 2.3<br>මල්ටි මීඩියා ඉදිරිපත් කිරීම.<br>විවාදයක් | පැය 3 |
| 4 | ළමා සංවර්ධනය | - හැඳින්වීම, වර්ධනය අනුව ගති ලක්ෂණ කීපයක් වෙත අවධානය | ඩිමයි කඩදාසියක සකස් කළ වගුවක් | වගුවේ ළමා ගති ලක්ෂණ සඳහන් කර කෙටි සාකච්ඡාවක් 2.5 | |
| | | ළමා සංවර්ධනයේදී අවධානය යොමු කෙරෙන අංග<br>- කායික සංවර්ධනය<br>- මානසික සංවර්ධනය<br>-චිත්ත වේග සංවර්ධනය<br>- සමාජ සංවර්ධනය | තොරතුරු පත්‍රිකාව ඇමුණුම 2.6 | කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇමුණුම 2.7 | පැය 3 |
| 5 | ශිෂ්‍යයා හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණ | නිරීක්ෂණය, පරීක්ෂණ - සාධන, ලිඛිත වාචික, සම්මුඛ පරීක්ෂණ, ප්‍රත්‍යාවේක්ෂණ වාර්තා, ප්‍රත්‍යෙක අධ්‍යයන | | සාකච්ඡා ක්‍රමය | පැය 2 |
| | විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම | විශේෂ අවශ්‍යතා ඇති සිසුන් පිළිබඳ කටයුතු කළ ආකර පිළිබඳ අත්දැකීම් සාකච්ඡාවක්<br>- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් යනු කවුරුන්ද?<br>- සුහග ළමයි, ඔවුන්ගේ චර්යා, චර්යා රටා නිරීක්ෂණය කරන ආකාර, විශේෂිත | යොමු ප්‍රශ්න පත්‍රිකාව- ඇමුණුම 2.8 | ප්‍රශ්නකරණය හා බුද්ධි කළම්භනය | පැය 2 |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

| සැසිය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| | | හැකියා, මෙම ළමුන් සඳහා ක්‍රියා කළ යුතු පිළිවෙල<br>- ඉගෙනුම් ආබාධිත ළමයි චර්යා නිරීක්ෂණ. ඉගෙනුම් ආබාධිත බවට බලපාන සාධක, හඳුනා ගැනීමේ උපකරණ, උදව් කරන්නේ කෙසේද? | | | |
| | | චර්යා අක්‍රමතා ඇති ළමයි<br>-අවධානය අඩු, සමාජ ආක්‍රමණකාරී ළමයි<br>-චර්යා ලක්ෂණ හඳුනා ගැනීම | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් තොරතුරු පත්‍රිකා 2.10 | මල්ටි මීඩියා ඉදිරිපත් කිරීම හෝ තොරතුරු පත්‍රිකා මගින් අධ්‍යයනය කිරීම ක්‍රියාකාරකම 2.9 | පැය 2 |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමග එක්වන්න...

4. අමතර ක්‍රියාකාරකම්

4.1. ඔබේ එදිනෙදා පන්ති කාමර කටයුතු වලදී අත්දකින අභියෝගාත්මක ගැටලු පාදක කර ගනිමින් ප්‍රත්‍යාවේක්ෂණ ජර්නලයක් ලිවීමට පුරුදුවන්න. මෙය සතියට දින 2වත් ලිවීමට යොමුවන්න.

4.2. ඔබේ පන්තියේ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනාගන්න.

- නිරන්තර නිරීක්ෂණයෙන් හෝ වෙනත් ක්‍රමවේද භාවිතයෙන් ඔබ හඳුනාගත් ලක්ෂණයේ ස්වභාවය තහවුරු කරගන්න.

ඔබගේ ප්‍රත්‍යාවේක්ෂණ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කළමනාකරණය කර ගැනීමට භාවිතා කරන්න.

ඔබගේ වැදගත් අනාවරණයන් මිතුරු කණ්ඩායම් සමග හුවමාරු කරගන්න.

ඇමුණුම 1.1

පළමුවන සිද්ධිය

3 ශ්‍රේණියේ සිසුනට හැඩතල හඳුනා ගැනීමේ පාඩමක් ඉගැන්වීමට ගුරුවරියකට අවශ්‍ය විය. මේ සඳහා ඇය විවිධ හැඩ තල කට්ටල කිහිපයක් ගෙනවිත් තිබුණි. සමහර ඒවා ඝණ කඩදාසි වලින් සකසා තිබුණි. මේ සියල්ල පන්තියට ගෙන ගොස් මේසය මත තබා පාඩම ආරම්භ කළාය. එක් එක් හැඩය පෙන්වමින් හැඩ හඳුන්වා දුන්නා ය. මේ අතරතුර සිසුන් දෙදෙනෙක් නැගිට මේසය ළඟට පැමිණ හැඩතල දෙස ආශාවෙන් බලා සිට කිහිපයක් අතට ගත් හ. අසලම කණ්ඩායම පැමිණ කිහිපයක් රැගෙන ගොස් වාඩි විය. තවත් කිහිප දෙනෙක් නැගිට මේසය වටා රොක් වූහ. පන්තිය කලබලකාරී විය. අසල්වැසි පන්ති ගුරුවරිය ද දොර ළඟට විත් බාධාකාරී බව ඇඟෙව්වා ය. එවිට ගුරුවරිය නිශ්ශබ්ද ව වාඩි වෙන්න යයි සිසුන්ට අන දුන්නාය. මේ අතර සීනුව නාදවිය.

දෙවන සිද්ධිය

"පද්මා" නැමැති ගුරුවරිය පන්තියට පැමිණියා ය. ළමෝ නැගිට "සුභ උදෑසනක් වේවා" යයි ප්‍රාර්ථනා කළ හ. ඇයත් පෙරළා ඔවුන්ට සුභ පැතුවා ය.
භාෂා ප්‍රහේලිකා සම්බන්ධ තරඟයක් පැවැත්වීම එදිනට නියමිත ව තිබිණි. පන්තිය වර්ණ දෙකක් අනුව කාණ්ඩ දෙකකට බෙදන ලදී. එක් එක් කණ්ඩායමට නමක් දී එකිනෙකාට මුහුණලා අසුන් ගැනීමට සලස්වන ලදී. ඉන් පසු ගුරුවරිය පහත දැක්වෙන උපදෙස් ලබා දුන්නා ය.
"මම සෑම කෙනෙකුට ම ප්‍රශ්නයක් ලියා ඇති කාඩ්පත බැගින් දෙනවා. එක් කෙනෙකු අනිත් කණ්ඩායමේ සාමාජිකයෙකුට ප්‍රශ්නයක් ඉදිරිපත් කළ යුතු යි. සෑම නිවැරදි උත්තරයකට ම ලකුණු 10ක් ලැබෙනවා."
සෑම කෙනෙකුට ම ප්‍රශ්න ඇසීමට හා උත්තර දීමට අවස්ථාව දෙන ලදී. අවසානයේ දී ගුරුවරිය ලකුණු එකතු කොට ජයග්‍රාහක කණ්ඩායමට තිළිණයක් ප්‍රධානය කළා ය. ඒ සමඟ ම පිළිතුරු දීමට අපහසු වූ තැන් ද පැහැදිලි කර දෙන ලදී.

ඇමුණුම 1.2

නිර්වචන

"කළමනාකරණය යනු සංවිධානයක අරමුණු ඉටු කරගැනීම සඳහා එම සංවිධානයෙහි තිබෙන මානව සහ අනෙකුත් සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම යන කාර්යයන් ඇතුළත් ක්‍රියාවලිය යි." - ස්ටෝනර්, ෆ්‍රීමන් සහ ගිල්බර්ට් 1990

"සිසුන් සහිත පන්තියක් මනා ව හසුරුවා ගෙන යාම පන්ති කළමනාකරණය ලෙස හැඳින් විය හැකිය. පන්ති කළමනාකරණය යන සංකල්පය පන්ති පාලනයට වඩා වෙනස් වූ පුළුල් කර්තව්‍යයකි. "පාලනය" යන්න කළමනාකරණයේ දී එක් කාර්යයක් පමණි. එහෙත් පන්ති කළමනාකරණයේ දී සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය, සම්බන්ධීකරණය, ගෘහ පාලනය, පෝෂණය ආදී විවිධ කළමනාකරණ කටයුතු කිරීමට සිදු වේ." - ජොන්සන් සහ බෲක් 1997

"හිතකර චර්යාවන් උපස්ථම්භනය කිරීමෙන් ද අහිතකර චර්යාවන් නිරුන්ධනය කිරීමෙන් ද පන්ති කාමර පරිසරය සක්‍රීය ලෙස පාලනයට නතු කිරීමේ ක්‍රියාවලිය පන්තිකාමර කළමනාකරණය වේ." - ගිබ්සන් 1981



SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය එක්වන්න...


ඇමුණුම 1.3 (දෙන ලද රූපය)

ඇමුණුම අංක 1.3.2 දෙන ලද රූපයේ දෙපැත්තේ ම ඇත්තේ පන්ති කාමරයක රූප වේ.
එය කොටස් කිහිපයකට කපාගෙන එවැනි කොටස් කට්ටලය බැගින් කණ්ඩායම් වලට බෙදා දෙන්න.
ඒවා ගලපා රූපයක් සෑදීමට යොමු කරන්න. මෙම ක්‍රියාවලිය තුළ කාලය, නායකයන් මෙහෙය වූ ආකාරය ආදිය ගැන සාකච්ඡා කර කළමනාකරණ ක්‍රියාවලියෙහි අවස්ථා කෙරෙහි අවධානය ලබා ගැනීම.

ඇමුණුම 1.4

**කළමනාකරණ ක්‍රියාවලිය**

කළමනාකරණ ක්‍රියාවලිය එකිනෙකට සම්බන්ධ කාර්යයන් සමූහයකින් සමන්විත ය. කළමනාකරණය සඳහා වැදගත් වන මූලික කාර්යයන් හා වැදගත් කාර්ය දාර්ශනිකයන් හා කළමනාකරුවන් විවිධ අවස්ථාවල විවිධ ලෙස වර්ග කොට දක්වා ඇත. මෙම මූලික කාර්යයන් 7ක් ලෙස ලූතර් ගුලික් සඳහන් කරයි. එනම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය, වාර්තාකරණය හා අයවැයකරණය යනු වෙති. ස්ටෝනර් එය සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය කිරීම ලෙස විග්‍රහ කරයි. සර්ටෝ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, බලපෑම් කිරීම හා පාලනය කිරීම ලෙස දක්වා ඇත. වර්තමානයේ බොහෝ කළමනාකරුවන් හා දාර්ශනිකයන් කළමනාකරණ කාර්යය 4 කට ගොනු කර ඇත. එනම් සැලසුම්කරණය, සංවිධානය කිරීම, නායකකරණය සහ පාලනය කිරීම වශයෙනි. මෙම මූලික කාර්යයන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියට ද සමීපතාවයක් පෙන්වයි.




කළමනාකරණ ශ්‍රිතයන්

- සැලසුම්කරණය
- සංවිධානකරණය
- නායකකරණය
- පාලනය

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සම්බන්ධ වන්න...

**සැලසුම්කරණය**

අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීම සඳහා අවිනිශ්චිතභාවය සම්බන්ධ ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ ක්‍රියාවලිය සැලසුම්කරණය යි. ඉලක්ක ලබා කර ගැනීමට මෙ මගින් මහ පෙන්වයි. කළමනාකරණයේ වැදගත් ම ප්‍රාථමික කාර්යය සැලසුම්කරණය යි. මෙයින් සෙසු කළමනාකරණ කාර්යයන්ට පදනම දමනු ලබයි. සැලසුම්කරණ කාර්යයේ දී අරමුණු පිහිටුවා ගැනීම, අරමුණුවලට අදාල ව වර්තමාන තත්වය නිශ්චය කිරීම, අනාගත තත්වයන් පිළිබඳ පුරෝකථනයන් දියුණු කිරීම, උපකාරී සැලසුම් පිළියෙල කිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම සිදු වේ. අවසානයේ සත්‍ය ප්‍රතිඵල අපේක්ෂා කරන ප්‍රතිඵල සමඟ සැසඳිය යුතු වේ.

**සංවිධානකරණය**

පොදු පරමාර්ථයන් හෝ පරමාර්ථ කිහිපයක් ලබා කර ගැනීම සඳහා පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් සාමූහික ව එකට වැඩ කිරීමේ ක්‍රියාවලිය සංවිධානය නම් වේ. පරමාර්ථවලට ලබා විය හැකි පරිදි සංවිධානයේ සාමාජිකයන් අතර සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලිය ද මීට අයත් ය. සංවිධානකරණයේ දී ආයතනයක සෑම පුද්ගලයකු ම අතර අදාල කාර්යය කොටස හා අධිකාරිය පැවරීම කෙරේ. ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයින් සම්බන්ධීකරණය කර ගැනීම හා ඔවුන්ගේ උපරිම හැකියාවන් හා පරිශ්‍රමයන් ලබා ගැනීම, ද්වි ගණනය වැලැක්වීම, පුද්ගල කණ්ඩායම් අතර ගැටුම් අවම කිරීම, සම්පත් නාස්තිය මඟ හැරවීමට අවකාශ මෙ තුලින් ලැබේ. ආයතනයක කටයුතු වල මනා සන්නිවේදනය, පාලනය සඳහා සංවිධානකරණය ප්‍රභල පිටිවහලක් වේ.

**නායකකරණය**

නායකත්වය යනු “සංවිධානයක අරමුණු ලබාකර ගැනීම සඳහා යටත් අයට ඔවුන්ගේ රාජකාරීන්, සූදානමින්, හැකියාවකින් සහ උනන්දුවෙන් ඉටු කිරීම පිණිස බලපෑම් කිරීමේ කලාවයි.” මෙහිලා අන්‍යයන්ගෙන් කටයුතු කර ගැනීමේදී බලැපෑම් කිරීමේ දී අභිප්‍රේරණය කිරීම ඉතා වැදගත් ය. නායකත්වය දෙ ආකාරයකින් ලැබේ. පුද්ගලයකු විසින් උසුලන තනතුරු ඔස්සේ ඔහුට ලැබෙන නායකත්වය විධිමත් නායකත්වය යි. මෙම අධිකාරිත්වය බලයට අමතර ව ඔහු හෝ ඇය විසින් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගෙන යාමේ දී කළ හැකි බලය අවිධිමත් නායකත්වය යි. සාර්ථක කළමනාකරුවෙක් විධිමත් හා අවිධිමත් නායකත්වය වන දෙකම ඵලදායී ලෙස භාවිතා කරයි.

සෑම කළමනාකරුවෙකු ම සාර්ථක නායකයකුගේ භූමිකාවෙහි නිරත විය යුතු ය. මේ සඳහා විවිධ නායකත්ව න්‍යායන් තුළ විවිධ නායකත්ව ශෛලීන් භාවිතා කෙරේ. නායකත්වය අවස්ථානුකූල ව නම්‍යශීලී දෙයක් වන නිසා තම යටත් අයගේ හැකියා පළපුරුද්ද යනාදිය හඳුනා ගත යුතු ය. නායකත්ව ශෛලීන් ආඥා දායක, ප්‍රජාතන්ත්‍රවාදී හා වන්නාටවාදී ස්වරූප වලින් ක්‍රියාත්මක කරනු දැකිය හැකි ය. ඒකාධිපති නායකයා තමා ම පමණක් පාලනය, අධීක්ෂණය හා තීරණ ගැනීම සිදු කරයි. සෙසු අය සහභාගී කර නො ගනී. ප්‍රජාතන්ත්‍රවාදී නායකයා සෙසු අයට නිතර උදව් වන, බලතල පවරන, නායකයාට රුකුල් දෙන අයෙකි. වන්නාටවාදී නායකයා ආයතනයට වඩා තමාගේ ආරක්ෂාව ගැන සිතයි. අවම මට්ටමින් කටයුතු කර වගකීමෙන් ගැලවීමට බලයි. සොයාබැලීම අනවශ්‍ය යැයි සිතයි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමග එක්වෙන්න...

පාලනය

"සත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිඵල වලට එකඟ බව තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය" පාලනය නම් වේ.

ආයතනයේ පරමාර්ථ අනුව ඉටු වන ලෙස එහි කටයුතු තහවුරු කර ගැනීම පාලන කාර්යය මඟින් සිදු වේ. නූතන සමාජය පිළිගනු ලබන වැදගත් පාලන ක්‍රමයක් වනුයේ පූර්ණ තත්ව කළමනාකරණය යි. (Total Quality Management) කළමනාකරුවන් විසින් පාලන කටයුතු වල දී සම්බන්ධතාවය හා කාලය පිළිබඳ ව අවධානය යොමු කළ යුතු වේ. පාලන කාර්යයේ දී ආයතනය අපේක්ෂා කරන තත්වයෙන් වෙනස් වීම හඳුනා ගෙන ඒවා නිවැරදි කර ගැනීමේ ක්‍රියාව සිදු වේ. සැලසුමේ දී පිහිටුවන ලද සංවිධාන අරමුණු පදනම් කොට කාර්යඵල, ප්‍රමිතීන් පිහිටුවීම, සත්‍ය කාර්යඵල මැනීම, සත්‍ය කාර්යඵල ප්‍රමිතීන් සමඟ සැසඳීම හා ඒ සඳහා නිවැරදි ක්‍රියා මාර්ග ගැනීම සිදු වේ. අවසානයේ සැලසුමේ පිහිටුවන ලද අරමුණු සමඟ සසඳනු ලැබේ.

පාලනය තුලින් සංවිධානයේ කටයුතු කාර්යක්ෂම ව ඉටු කර ගැනීම, අඛන්ඩ ව, ගුණාත්මක බව තහවුරු කර ගෙන පවත්වා ගෙන යාම, තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දීම, ඉක්මන් සේවාවක් ලබා ගැනීම, අගයයන් එකතු කිරීම, පුද්ගල හා කණ්ඩායම්වල කාර්යය සඵල බව මැන ගැනීමට හැකි වීම ආදී කරුණු රාශියක් ඉටු වේ.

පාලන වර්ග 3කි.

1. ඉදිරි පෝෂණ පාලනය - ගැටළු ඇති වීම වැලැක්වීම සඳහා පියවර ගැනීම.
2. සහගාමී පාලනය - දැනට සිදුවන කටයුතු හා ක්‍රියාවලීන් සැලසුම් කිරීම
3. ප්‍රතිපෝෂණ පාලනය- විචල්‍යයන් හඳුනා ගැනීමෙන් පසු හේතු සොයා නිවැරදි ක්‍රියා මාර්ග ගැනීම

ඇමුණුම 1.5

ක්‍රියාකාරකම

පහත දැක්වෙන්නේ ප්‍රිය ජනක ඉගෙනුමකට බාධාකාරී යයි ගුරුවරයාට සිතෙන පන්ති වාතාවරණ කීපයකි. එය හෝ එය හා සමාන ඔබ අත් දැක ඇති පන්ති කාමර වාතාවරණයක් මෙනෙහි කර එහි ලක්ෂණ විස්තර කරන්න.

එය ප්‍රිය ජනක / යහපත් තත්වයකට ගෙන ඒම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගය සාකච්ඡා කර ක්‍රියාවලිය අනුපිළිවෙලින් ලියා දක්වන්න.

කණ්ඩායම් වාර්තාව ඉදිරිපත් කරන්න.

1 කණ්ඩායම

8 ශ්‍රේණියේ සිසුන්ගෙන් කොටසක් ගණිතය විෂය සඳහා අඩු සාධන මට්ටමක් පෙන්වයි.

2 කණ්ඩායම

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ එකතුවකි...

5 ශ්‍රේණිය සිසුන් 30 ක් සිටින පන්ති කාමරයකි. පන්තියේ ඩෙස්පුටු 40 ක් පමණ ඇත. එක් කොණක දෘෂ්‍යාධාර රාශියක් අවිධිමත් ව තබා ඇත. අවශ්‍ය සම්පත් ඇති බවක් පෙනුනත් ඉඩකඩ ඇසුරුණු බවක් ඇත. පන්ති භාර ගුරුතුමිය පවසනුයේ මෙම පන්තියේ ළමයින් ඉගෙනීමට කම්මැලි බව ය.

**3 කණ්ඩායම**

10 ශ්‍රේණියේ ගණිත පාඩම් අවසානයේ දෙනු ලබන අභ්‍යාස ඉක්මනින් නිවැරදි ව නිම කරන සිසුන් කීප දෙනෙක් වේ. ඔවුහු වැඩ නිම කර ගුරුතුමියට පෙන්වා අන් අය සමග කථා කරති. කඩදාසි කොළ පාස් කර ගනිති. අනෙක් අයට උසුළු විසිළු කරමින්, ගුරුතුමිය අභ්‍යාස පොත් බලන අතර තුර එහා මෙහා ඇවිදිති. මොවුන් අනෙක් සිසුන්ට බාධාකාරී ලෙස ගුරුතුමියට හැඟේ.

**4 කණ්ඩායම**

10 ශ්‍රේණියේ සාහිත්‍ය පාඩම උගන්වන ගුරුවරියට දෙපස පන්තිවල ඝෝෂාකාරී බව බහුල ව අත්විඳීමට සිදුවේ.

ඇමුණුම 1.6

ජර්නල් වාර්තා

ඇමුණුම 1. 7

පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ කාර්ය භාරය

ක්‍රියාකාරකම

පියවර 1 : සහභාගීවන්නන් කණ්ඩායම් 4 කට බෙදා පහත සඳහන් ඒවායින් ශීර්ෂ දෙක බැගින් වෙන් කර දෙන්න.

1. පන්ති කාමර කළමනාකරණයට අදාල ලිපි ලේඛන පවත්වා ගෙන යාම.
2. ශිෂ්‍යයා හඳුනා ගැනීම.
3. පන්ති කාමර විනය පවත්වා ගැනීම
4. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය
5. භෞතික හා මානව සම්පත්
6. උපකාරක ඉගැන්වීම්
7. විෂය සමගාමී කටයුතු
8. ප්‍රජා සම්බන්ධතා අන්‍යොන්‍යකරනය

පියවර 2 : එක් එක් කණ්ඩායමට දෙන ලද ශීර්ෂ යටතේ ගුරුවරයාගේ කළමනාකරණ කාර්යභාරයන් ලැයිස්තුගත කිරීමට යොමු කරන්න. අත්දැකීම් උදාහරණ ලෙස ගැනීමට යොමු කරන්න.

පියවර 3 : කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කරවීම. (ඉදිරිපත් කිරීම සඳහා විවිධ ක්‍රම භාවිතයට යොමු කරන්න.)

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ එකතුවකි...

පියවර 4 : සමාලෝචනයක යෙදෙන්න.

**අමතර කියවීම**


1. අතුකෝරල ඩී. ආර්. සහ අතුකෝරල එච්. එන්., අධ්‍යාපන මනෝ විද්‍යාව හා ගුරුවරයා (1992) ශික්ෂා මන්දිර ප්‍රකාශන, පානදුර.
2. ගජවීර ජේ., පන්ති කාමර කළමනාකරණය
3. වික්‍රමසිංහ එල්. කාර්යක්ෂම හා ඵලදායී ගුරුවරයකු වීමට නම්
4. කලුආරච්චි කේ. ඒ. එස්. පී. කළමනාකරණය (අනුකලිත ප්‍රවේශය) 2000, කර්තෘ ප්‍රකාශන
5. කස්තුරිආරච්චි, සී. අධ්‍යාපන කළමනාකරණය 2009
6. කොතලාවල, එල්. සී. පියාජේගේ මනෝවිද්‍යා න්‍යාය (1979) ලේක් හවුස්, කොළඹ.
7. ජනාධිපති කාර්ය සාධන බලකාය - 1997 - සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
8. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිරාමුවක් සඳහා යෝජනා
9. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය.
10. Transforming School Education in Sri Lanka- 2011 - The world bank, Colombo office.


ඇමුණුම 2.1

**ළමයා හඳුනාගැනීමේ වැදගත්කම**

අද අප ජීවත් වන්නේ ළමයා ගැන වැඩි අවධානයක් යොමු වූ යුගයක ය. ළමා අයිතිවාසිකම් කෙරෙහි ද එ වැනිම අවධානයක් පවතී. එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ ගිවිසුම් මඟින් ද, රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළින් ද ඒවා ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසා ඇත. එහෙත් පාසල් පද්ධතිය තුළ සිදුවන සිදු වීම් දෙස බැලීමේ දී ළමයා මැනවින් හඳුනා නො ගැනීම හා ළමයා හඳුනා ගෙන අදාළ පියවර නොගැනීමෙන් ශිෂ්‍ය, ගුරු දෙ පිරිසට ම අහිතකර ප්‍රතිඵලයනට මුහුණ දෙන අවස්ථා බහුල ව දක්නට ඇත. එය සිය දිවි නසා ගැනීම්, වරද කරුවන් ලෙස නීතියට හසු වීම්, පාසල් මාරු කිරීම, පාසලේ විනය බිඳ වැටීම්, විවිධ අපචාර කෙරෙහි සිසුන් යොමු වී ළමයා පාසලෙන් ගිලිහී යාම හෝ ප්‍රතික්ෂේප කිරීම් මේ අතර සිදු වේ. එ බැවින් ළමයාගේ ස්වභාවය මෙන් ම සාමාජීය ව ළමයාට හිමි තැන හඳුනා ගැනීම ගුරුවරයාට සිය කාර්ය ඉටු කිරීමට පහසුවක් වනු ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය 1959 සම්මත කළ ප්‍රකාශනය ළමයා ගැන අවධාරනය කරමින් අඩු තරමින් ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලැබීමට ළමයාට අයිතියක් ඇති බව සඳහන් කරයි. එය නිදහස් මෙන් ම අනිවාර්ය විය යුතු ය. සම අවස්ථා පදනම් කර තම විභව්‍යතා දියුණු කර ගැනීමට, තනිව තීරණ ගැනීමට, සමාජ වගකීම් වර්ධනයට හා සමාජයට අවශ්‍ය පුද්ගලයකු වීමට ඉඩ සැලසිය යුතු බව දැක් වේ. තව දුරටත් දක්වන්නේ ජාති, අගම්, භාෂා හෝ දේශපාලන මතය නොව දරුවාගේ අබල දුබලතා හෝ විශේෂතාවක් නොමැති ව සිය අයිතිවාසිකම් භුක්ති විඳීමට ඔහුට ඉඩ ඇති බවත් තමාට අහිතකර ඕනෑ ම අවස්ථාවක දී හෝ යම් දඬුවමකට හෝ එරෙහි ව නැගී සිටීමට එම සම්මුතියෙන් ආරක්ෂාව ලබාදී ඇති බවත් ය.

විශ්ව ළමා වර්ෂය ලෙස 1979 නම් කර ළමයාගේ සුභ සිද්ධිය ඉලක්ක කර මින් එක්සත් ජාතීන්ගේ සංවිධානය දරුවාට වැඩි අවධානයක් යොමු කළ යුතු බවට ලොව සෑම රටකට ම වැදගත් පණිවුඩයක් දී ඇත. තව ද, 70 දශකය ආරම්භයේ දී යුනෙස්කෝව ප්‍රකාශයට පත් කළ 'දිවිපැවැත්ම සඳහා ඉගෙනුම' හා 1998 නිකුත් වූ 'ඉගෙනුම් ඔබ සතු වස්තුව' ඩෙලෝස් 1998 යුනෙස්කෝ වාර්තාවෙන් 21 වන ශත වර්ෂයේ

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමග එක්වන්න...

අධ්‍යාපනය සැලසුම් කිරීමේ දී දරුවාට අධ්‍යාපනය දීමේ දී ඉගෙනුම ලබන්නෙකු ලෙස වැදගත්කම අවධාරනය කිරීමෙන් ද ළමයාට විශේෂ තැනක් ලබා දී ඇත.

1945 කන්නන්ගර යෝජනා පසුබිම් ව නිදහස් අධ්‍යාපනය, මවු බසින් අධ්‍යාපනය, පාසල් ළමුන්ට දිවා ආහාර ලබා දීම, මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම ආදිය තුලින් සිසුන් පාසලට පැමිණීම වැඩිකර ගැනීමට ප්‍රයත්න දරා ඇත. ඉන්පසු විටින් විට පාසල් පද්ධතියේ වෙනස්කම් ඇති කරලීම සඳහා ඉදිරිපත් වූ අධ්‍යාපන යෝජනා අනුව “සියලුම ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ” ප්‍රතිපත්තිය ඉදිරියට ගොස් ඇත. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රාථමික අධ්‍යාපනයේ නව මුහුනුවරකට මහ පාදා ළමුන්ගේ අභිරුචීන්ට ගැලපෙන පරිදි ඉගෙනීමේ නිරත කරවීමට ප්‍රයත්න දරා ඇත. තවදුරටත් 1991 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් පසු සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිසංස්කරණ, 1997 වාර්තාවට අනුව ළමුන් පාසල් නොයාමට හේතු විමසා ඒවාට ප්‍රතිකර්ම යෙදීමටත් පාසලට ඇතුලත් කර ගැනීමේ දී පවත්නා ගැටළු සඳහා ප්‍රතිකර්ම යෙදීමටත් කටයුතු කර ඇත.

2.2

චර්යා පැතිකඩ

- සමීර 3 ශ්‍රේණියේ ළමයෙකි. ඔහු අන් ළමුන්ට හිරිහැර කිරීමට කැමති ය. පොත්පත් ගැන සැලකිලිමත් නැත. කොළ ඉරා ඒවායින් කඩදාසි ගුවන් යානා සාදා මිතුරන් දෙසට විසි කරයි. ගුරු උපදෙස් පිළිපදින්නේ නැත. ගුරුවරුන්ගෙන් නිතර දඬුවම් ලබයි. එය ඔහුට පුරුදු ය. ගුරුවරු ගැන සැලකිලිමත් නැත. අවධානයෙන් කටයුතු නො කරයි. චිත්‍ර ඇඳීමට කැමති ය. එහෙත් අවශ්‍ය උපකරණ නැත.

- රාජිකා ඉතා ප්‍රිය මනාප ශිෂ්‍යාවකි. ඇය ගීත ගායනයට කැමති ය. විවේක ලද සැනින් මිතුරියන් වට කර සින්දු කීම පුරුද්දකි. පාසලේ ජනප්‍රිය ශිෂ්‍යාවකි. නිල ඇඳුම පිළිවළට අඳී. කොණ්ඩය පීරීම හා පවුඩර් දැමීම ගැන සැලකිලිමත් ය. “සුපර් ස්ටාර්” වීමේ සිහිනය ඇ තුළ ඇත. පාසලේ ඕනෑ ම සංගීත වැඩසටහනක දී ඇය හමු විය හැකි ය. ගෙදර වැඩ අතපසු කරයි.

- රවිඳු ඉගෙනුම ලබන්නේ 10 ශ්‍රේණියේ ය. ඔහු නම් ලකුණු කළ විගස පාසලෙන් පිටවී යයි. ජංගම දුරකථනය පාසලට රැගෙන එන බවට ද සැකයක් පවතී. සෑම විෂයකට ම පෞද්ගලික පන්ති වලට සහභාගී වේ. සාමාන්‍ය විෂය සාධනයක් පෙන්නුම් කරයි. ගුරු උපදෙස් නො පිළිපදී. “පැන්නා” යන නමින් ප්‍රසිද්ධ ය. පන්තියේ මිතුරන් නො මැත.

- චතුරිකා 8 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. පාසලේ බාහිර කටයුතු වලදී උදව් කිරීමට කැමති ය. ගුරුවරයාට කීකරු ශිෂ්‍යාවකි. පොත් කියවීමට කැමති ය. ඉගෙනීමට හැකියා ඇත. එහෙත් අන් ළමුන්ට බාධා කරයි. ප්‍රියතම විෂය ඉංග්‍රීසි භාෂාව යි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සම්බන්ධ වන්න...

2.3

ක්‍රියාකාරකම

උපදෙස්


- ❖ සහභාගිතයන් කණ්ඩායම් 4 ට බෙදා 2.2 හි එක් චර්යා පැති කඩක් බැගින් වෙන් කර දෙන්න.
- ❖ තෝරා ගත් චර්යා පැති කඩ අධ්‍යයනය කිරීමට යොමු කරවන්න.
- ❖ අධ්‍යයනය කළ චර්යා රටා වර්ධනය වීම සඳහා හේතු වී යයි සිතන කරුණු ලැයිස්තු ගත කරවන්න.
- ❖ කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කරවන්න.

ඇමුණුම 2.4

ළමා සංවර්ධනය පිළිබඳ වැදගත් වන න්‍යායයන්
ළමා සංවර්ධනය පිළිබඳ වැදගත් වන මනෝ විද්‍යාත්මක න්‍යායන්හි ඇතුළත් අදහස් කීපයක් මෙහි දැක් වේ.

1. ඒබ්‍රහම් මාෂ්ලෝගේ අවශ්‍යතා මතය

අවශ්‍යතා මතය අනුව ළමා සංවර්ධනය කුඩා කල සිට ම අවශ්‍යතා ඉටු වීම මත සිදු වන බව කිය වේ. මනුෂ්‍ය අවශ්‍යතාවයන් කිසියම් ධූරාවලියකට හෙවත් කිසියම් අනුක්‍රමාධිපත්‍යයකට ක්‍රියාත්මක වන බව මාෂ්ලෝ ප්‍රකාශ කර ඇත. එම ධූරාවලිය මෙසේ ය.




මෙම ධූරාවලියේ පහළම ස්ථරයෙහි ඇති පැවැත්ම සඳහා සහ ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා මූලික අවශ්‍යතා ලෙස සැලකේ. මිනිසාට පැවැත්ම සඳහා ආහාර, ජලය, නිවාස, වාතය අවශ්‍ය ය. අනතුරුවලින් ද ආරක්ෂා වී සිටීමට කැමති ය. කායික හා ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා සම්පූර්ණ වූ විට නැතහොත් තෘප්ත

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

වූ විට ඊට ඉහල මට්ටමේ ඇති අවශ්‍යතා තෘප්ත කර ගැනීමට පෙළඹේ. එනම් සන්තකයන් ඇති කර ගැනීම, ස්නේහය ලබා ගැනීම, ආත්ම ශාක්ෂාත්කරණය ලබා ගැනීමටත් අවශ්‍යතාවයක් ඇති වේ. මෙහි ආත්ම ප්‍රේරණය ඉහල ම අදියර යි. පුද්ගලයාගේ සියලු ම විභව්‍යතාවයන් ඉෂ්ඨ කර ගැනීම ඉහළම අවශ්‍යතාවය යි. මෙහි ම පහළම තලයේ ඇති පැවැත්ම, ආරක්‍ෂාව, ස්නේහය හා ආත්ම සම්මානනය පිළිබඳ අවශ්‍යතා ඌන අවශ්‍යතා ලෙස මාෂ්ලෝ සඳහන් කරයි.

මෙම අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස තෘප්ත නො වූ විට ඒවා ඉටු කර ගැනීම සඳහා පෙළඹ වීම ඇති වේ. ඒවා ඉටු වූ විට පෙළඹ වීම නැති වේ. ඉහළ මට්ටමේ අවශ්‍යතා, එනම් රසික සම්මානනය හා ආත්ම ශාක්ෂාත්කරන අවශ්‍යතා තෘප්ත වූ කල්හි එවා සඳහා පෙළඹවීම වැඩිවේ.

ආහාර, ජලය වැනි අවශ්‍යතා ඉටු නොවූ විට, රෝගීතත්වයක් ඇති වූ විට ළමයා තුළ ඉගෙනීමට උනන්දුවක් ඇති නොවේ. තම සන්තකයන් නොමැතිවීම, පවුලේ අඩ දබර, දෙමාපියන් වෙන් වීම ආදිය තිබිය දී සුරක්‍ෂිත බවක් නොමැත. එවන් ශිෂ්‍යයිනට ඉහළ අවශ්‍යතා ඇති වීමට පෙළඹවීමක් ඇති නොවේ. පන්ති කාමරයේ ද ආරක්‍ෂිත වාතාවරණයක් තිබිය යුතු ය. ගුරුවරයාට බිය ඇති නොවන පරිසරයක් පන්තියේ තිබිය යුතුය. මේ නිසා ගුරුවරයාට ශිෂ්‍ය චර්යා තේරුම් ගැනීමට මෙම න්‍යාය බෙහෙවින් උපකාරී වේ. ගුරුවරයා විසින් ශිෂ්‍යයින් අවමානයට අපහාසයට ලක් නො කල යුතු ය. මේ නිසා අවශ්‍යතා ක්‍රියාවලිය හඳුනා ගෙන ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ. පහළ තලයේ අවශ්‍යතා ඉෂ්ඨ වුවහොත් ඉහළ අවශ්‍යතා කෙරෙහි පෙළඹීමක් ඇති වේ. ශිෂ්‍යයින්ගේ සුරක්‍ෂිතතාවය තහවුරු කොට හොඳින් ඉගැන්විය යුතු ය. කණ්ඩායම් වැඩ, සාමූහික සාකච්ඡා ආදිය තුලින් ලභා කරගැනිමට ඉඩ සැලසිය හැකි ය. ශිෂ්‍ය අභිරුචීන්ට අනුව ඉගෙනුම් ක්‍රියාවලිය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමෙන් සිසු දක්‍ෂතා එළි දැක්වීමට අවස්ථාව සම්පාදනය කළයුතු වේ.

2. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මතය

සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ විග්‍රහ වාදය ගොඩ නැගී ඇත්තේ කුඩා කාලයේ දී පුද්ගලයාගේ මනසේ ඇතිවන යම් යම් බලපෑම් පදනම් කරගෙන ය. වයස අවුරුදු 5 වන විට පුද්ගලයාගේ පෞරුෂය වැඩී අවසන් වන බව ෆ්‍රොයිඩ්ගේ මතය යි. මේ නිසා බාල කාලය තුල ඇතිවන ඌනතා හෝ ප්‍රභලතා පෞරුෂයෙහි අඩු වැඩි වීම කෙරෙහි බලපායි. වැඩුනු පුද්ගලයාගේ පෞරුෂය තීරණය වන්නේ ඒ පදනම මත යි.

ෆ්‍රොයිඩ් පෞරුෂයේ මනෝ ලිංගික වර්ධනයන් ගැන සඳහන් කරයි. ළමා වර්ධනයේ දී සිදු වන වෙනස්කම් ජීව විද්‍යාත්මක පෙළඹවීම් මත සිදු වන බව ඔහු කිය යි. ෆ්‍රොයිඩ් දක්වන ළමා සංවර්ධන අවධි තුනකි.

1. පූර්ව ලිංගික අවධිය
2. ගුප්ත ලිංගික අවධිය
3. වෘද්ධ ලිංගික අවධිය

උප්පත්තියේ සිට අවුරුදු 5 දක්වා කාලය පූර්ව ලිංගික අවධිය යි. වැඩිවිය පැමිණීම දක්වා කාලය ගුප්ත අවධිය ලෙස ද ඉන්පසු වෘද්ධ ලිංගික අවධිය එළඹෙන බවත් ෆ්‍රොයිඩ් සඳහන් කරයි.

ෆ්‍රොයිඩ්ගේ මනෝ විග්‍රහ විෂයෙහි වැදගත් මූලධර්මය නම් අවරෝධණ ක්‍රියා පටිපාටිය යි. එනම් ඉටු නොවූ ආශා යටි සිතේ තැන්පත් වීමයි. පූර්ව ලිංගික අවධියේ දී සිදුවන අවරෝධනයන් පදනම් කර ගෙන අනාගත පුද්ගල පෞරුෂය සකස් වේ. පුද්ගලයාගේ තෘප්ති නොවූ ආශාවන් නිසා ඇතිවන ඉච්ඡාභංගත්වය

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ එකතුවකි...

සමනය කර ගැනීම සඳහා යොදා ගන්නා සංරක්ෂණ ප්‍රයෝග පෞරුෂ ලක්ෂණ ලෙස මතු වේ. අනාගත පුද්ගල චර්යාවන් මතු වන්නේ මේ ලක්ෂණ අනුව යි.

3. ජීන් පියාජේ

පියාජේගේ බුද්ධි වර්ධන න්‍යායන් වයසත් සමඟ බුද්ධිය වර්ධනය වන අයුරු ඉදිරිපත් කර ඇත. පරිසරය සමග ගැටීම නිසා බුද්ධිය සංවර්ධනය වන්නේ ය යන්න ජ්යාජේගේ න්‍යායේ හරය යි. බුද්ධි සංවර්ධනයේ දී මතු වන ලක්ෂණ දෙකකි. එනම් සංරක්ෂණ හැකියාව සහ ප්‍රත්‍යාවර්තන හැකියාව වේ.

සංරක්ෂණය යනු සංවිධානය හා අනුවර්තනය අතර ඇති වන සමතුලිත බවෙන් පසු පුද්ගලයා තුළ ඉතිරි වන බුද්ධිමය හැකියාව යි. ප්‍රත්‍යාවර්තනය යනු යම් කිසි චින්තන ධාරාවක කලින් තත්වය කරා ආපසු යාමේ හැකියාව යි. බුද්ධි සංවර්ධනයේ අවධි 4ක් පියාජේ දක්වා ඇත.

1. ඉන්ද්‍රිය චාලක අවධිය. උපතේ සිට අවුරුදු 2 දක්වා. කිරි ඉරීම, යමක් අල්ලා ගැනීම, ශබ්ද නිකුත් කිරීම. ක්‍රමයෙන් යම් යම් ද්‍රව්‍ය සහ ඒවා අතර සම්බන්ධතාවයන් තේරුම් ගනී. ශබ්ද හා චලන අනුකරණය කරයි. ක්‍රීඩා කිරීම හා අනුකරනය

2. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය. අවුරුදු 2 සිට අවුරුදු 7 දක්වා කාලය. භාෂා හැසිර වීමට හැකි ය. චර්යාවේ සංයුක්ත ස්වභාවය, ආපස්සට සිතීමේ හැකියාව නොමැත. ආත්ම කේන්ද්‍රීය ස්වභාවය. එක් අවස්ථාවකදී එක් හේතුවක් පමණක් දකී. සිද්ධියක සමස්ථය දැකිය නොහැක. සංරක්ෂණ හැකියාව එනම් ද්‍රව්‍යක වෙනත් ලක්ෂණ වෙනස් වුව ද මූලික ලක්ෂණ වෙනස් නොවන බව ඇත.

3. සංයුක්ත චින්තන අවධිය. අවුරුදු 7 සිට අවුරුදු 11 දක්වා කාලය. වර්ගකිරීමේ හැකියාව, තාර්කික ලෙස සිතීම, ද්‍රව්‍ය පිළිවෙලට සකස් කිරීමේ හැකියාව ඇත. ප්‍රමාණය, බර, පරිමාව තේරුම් ගනී. ප්‍රත්‍යාවර්තන හැකියාව ඇත. ආත්ම කේන්ද්‍රීය චින්තනයෙන් මිදෙයි. සංයුක්ත ද්‍රව්‍ය භාවිතයෙන් ගැටළු නිරාකරණය කර ගනී.

4. විධිමත් චින්තන අවධිය. අවුරුදු 12දී ආරම්භ වේ. නව යෞවන වයස් සීමාව දක්වා පවතී. තාර්කික චින්තනය පහළ වේ. මුල් අවධියේ දී සංයුක්ත චින්තන අවධියේ දී සංයුක්ත දෑ ඇසුරින් ගැටළු විසඳයි. වියුක්ත චින්තන අවධියේ දී වාචික අභ්‍යුපගමනයෙන් ගැටළු නිරාකරණය කරයි. වියුක්ත සංකල්ප ඉගෙනීමට පුළුවන.

එක් එක් මානසික සංවර්ධනයේ අවධි අනුව ඉගැන්වීම සැලසුම් කිරීම මගින් උපරිම ඉගෙනීමක් ලැබීමට සැලැස්වීමට ගුරුවරයාට හැකිවේ.

**ආරය සහ පරිසරය**

ළමා සංවර්ධනය කෙරෙහි ආරය සහ පරිසරය තීව්‍ර බලපෑමක් කරයි. දෙමාපියන් උරුම කොටගෙන එන ජීව විද්‍යාත්මක සාධක ආරය ලෙසත් දරුවා අන්තර් සබඳතා ඇතිකරගන්නා ගතික ස්වභාවයෙන් යුත් උත්තේජක සියල්ල පරිසරය ලෙසත් හැඳින් වේ.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

ආරය :

ජීවීන්ගේ මානසික හා ශාරීරික ගති ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරවන ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය ආරය යි. දරුවාගේ උප්පත්තිය සඳහා මව සහ පියාගේ දායකත්වය ආරය නමින් හැඳින් වේ. ආරමය ගුණාංග නිශ්චයවනුයේ මව සහ පියාගේ උරුමවන ජාන සම්බන්ධ වීමෙනි. පුද්ගලයින්ගේ කායික අංග ලක්ෂණ කෙරෙහි ආරයෙහි බලපෑමක් ඇත. කෙස්වල වර්ණය, හැඩය, සමේ පාට, මුහුණේ අංග ලක්ෂණ තීරණය කෙරෙහි ආරය බලපායි. පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි ආරය බලපාන බව පර්යේෂණ අධ්‍යයන වලින් අනාවරණය කර ඇත. මනුෂ්‍යයාට සෑදෙන සමහර ලෙඩ රෝග ආරයෙන් ඇති වේ. උදා : දියවැඩියාව, මානසික රෝග, වර්ණදේහවල අඩංගු ජානයන් විසින් ඇතැම් එන්සයිම නිපදවීමට අපොහොසත් වූ විට ඉන් මොළය පීඩාවට පත් වේ. මෙම දුර්වලතා ආරයෙන් ම හටගන්නා බව වෛද්‍ය විද්‍යාවෙන් සොයා ගෙන ඇත.

අයිසෙන්ක් සහ ආතර් ජොන්සන් යන මනෝ විද්‍යාඥයින් දෙදෙනාගේ මතය නම් බුද්ධි සංවර්ධනයට ආරය තීව්‍ර බලැපෑම් කරන බව යි. අනන්‍ය නිවුන් දරුවන් අතර බොහෝ දුරට සමාන බුද්ධි ඵලයක් තිබෙන බව නිව්මන්, ජ්‍රීමන් සම හොලිසින්ජර් පෙන්වා දී ඇත.

**පරිසරය :**

දරුවාගේ ජීවිතය හා බැඳී ඇති බාහිර උත්තේජක සියල්ල පරිසරය නමින් හැඳින් වේ. ළමයකුගේ බුද්ධිය ආරයේ ප්‍රතිඵලයක් ලෙස ජොන්සන් පවසන මතය බ්‍රයන් සීමන් නැමති මනෝවිද්‍යාඥයා ප්‍රතික්ෂේප කර ඇත. බ්‍රයන් සීමන් පවසන අන්දමට බුද්ධි සංවර්ධනය යනු පරිසරය හා සම්බන්ධ වූව කි. වෙන් කර හදා වඩා ගත් අනන්‍ය නිවුන් දරුවන් සම්බන්ධයෙන් වුඩ්වර්ත් කළ පර්යේෂණ වලින් පෙනී ගිය කරුණක් නම් බුද්ධි පරීක්ෂණ මඟින් බුද්ධිය මැනීමේ දී අධ්‍යාපනික වෙනස් කම් බුද්ධියෙහි වෙනසක් ඇති කිරීම කෙරෙහි බලපාන බව යි.

සමාජ සංවර්ධනයට හිතකර පරිසරයක් සම්පාදනය කර දුන් අවස්ථාවල ළමුන් වැඩිදෙනෙක් යහපත් සංවර්ධනයකට හිමිකම් කියන බව ස්කිම්ඩ් සොයා ගෙන ඇත. පරිසර අවබෝධකයන් දරුවන්ගේ යහපත් සංවර්ධනයට මූලාශ්‍ර වේ. පරිසරය සමාජ පරිසරය හා භෞතික පරිසරය යනුවෙන් දෙකොටසකි. සමාජ පරිසරය යනු පුද්ගලයා ඇසුරු කරන සාමාජිකයෝ ය. භෞතික පරිසරය යනු අනෙකුත් වටපිටාව ය.

වුඩ්වර්ත් පෙන්වා දෙන පරිදි පිළිසිඳ ගැනීමෙන් පසු බලපාන හැම සාධකයක් ම පරිසර සාධක වේ. ඒ අනුව ජීවියාම මුලින් ම හමුවන පරිසරය මවු කුසයි. මවගේ පෝෂණ තත්වය, මවට වැලඳෙන රෝග, විකිරණයට භාජනය වීම, මත්ද්‍රව්‍ය භාවිතය, දරුවාගේ කායික රෝගී බවට හා ඉන්ද්‍රිය දුබලතා ඇති කරව යි. මවගේ මානසික සුරක්ෂිත බව හා සමතුලනය, සමාජ පරිසරයේ සහනශීලී බව චිත්තවේගී හා මනුෂික සමබරතාව ඇති කරවයි. මෙය දරුවාගේ මානසික සුවය හා කායික දුබලතා වැලැක්වීමට හේතු වේ.

ආරයෙන් තීරණය වූ පුද්ගල ජීවිතය අනාගතයේ දී කුමන තත්වයක් ගන්නේ ද යන්න රඳා පවතිනුයේ පරිසරයෙන් බලපෑම අනුව යි. හොඳ මිනිසුන් අතර ඇති දැඩි වන මිනිසකු හොඳ මිනිසකු වන්නේත් නරක මිනිසුන් අතර ඇති දැඩි වන අයෙකු නරක මිනිසකු වෙන්නේත් මේ නිසා යි. ඇසුරු කරන්නන් නිසා ළමයින් මත්ද්‍රව්‍ය භාවිතය සම වයස් කාණ්ඩ ඇසුර ද මීට බලපායි. ළමා පරිසරය මෙන් ම ජීවත් වන භෞතික වටපිටාව ද පුද්ගල සංවර්ධනයට බලපායි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයට සම්බන්ධ වන්න...

ඇමුණුම 2.5

පහත පරිදි සකසා ගත් වගුවක ප්‍රාථමික, ද්විතීයික, උසස් පෙළ පන්තිවල ගති ලක්ෂණ කීපයක් සහභාගිකයන් ලවා ලියවීම.

| ප්‍රාථමික | ද්විතීයික | උසස් පෙළ |
|---|---|---|
| සතුටින් සිටී<br>. . .<br>. . .<br>. . . | උත්සහවන්ත ය.<br>. . .<br>. . .<br>. . . | නිර්භීත ය.<br>. . .<br>. . .<br>. . . |

මෙසේ කීපයක් ලියවා ඒවායේ ස්වභාවය එක් එක් වර්ධන අංශවලට සම්බන්ධතාව ඇති බව ඉස්මතු කරන්න. (උදා : සතුටින් සිටියි - චිත්තවේගී)

ඇමුණුම 2.6

ළමා සංවර්ධනය

ළමා සංවර්ධනය අවස්ථා 4 ක් යටතේ දැක්විය හැකි ය. එනම්

1. ශාරීරික වර්ධනය
2. මානසික වර්ධනය
3. චිත්තවේගීය වර්ධනය
4. සමාජයීය වර්ධනය යනුවෙනි.

මේවා එකිනෙකට කිසියම් අයුරකින් සම්බන්ධ වේ. මෙම සිව් වැදැරුම් වර්ධනය පිළිබඳ කරුණු දැක්වීමේ දී ඒ පිළිබඳ ව විවිධ මනෝ විද්‍යාඥයින්, දාර්ශනිකයන් කරුණු ඉදිරිපත් කර ඇත. ජීන් පියාජේ, ජීන් ජැක් රූසෝ, සිග්මන් ෆ්‍රොයිඩ් වැනි අයට මින් ප්‍රධාන තැනක් හිමි වේ. ෆ්‍රොයිඩ් චිත්ත වේග අංශය පිළිබඳ කරුණු දැක්වූ අතර පියාජේ විවිධ වයස් මට්ටම් අනුව බුද්ධි වර්ධනයේ වෙනස්කම් ඉදිරිපත් කළ බව දුටිමු.

ළමා වර්ධනය පාසල් අවධීන් වශයෙන් සලකා වර්ධනය පිළිබඳ අධ්‍යයනයේ යෙදී ම ගුරුවරයාට වැදගත් වේ. ඒ අනුව

1. පෙර පාසල් අවධිය - අවුරුදු 2- අවුරුදු 5 දක්වා
2. ප්‍රාථමික පාසල් අවධිය - අවුරුදු 5- අවුරුදු 11 දක්වා
3. ද්විතියික පාසල් අවධිය - අවුරුදු 11-අවුරුදු 18 දක්වා

වශයෙන් වෙන් කර වර්ධන අංශ පිළිබඳ ව විමසා බැලීම ප්‍රයෝජනවත් ය.



SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමග එක්වන්න...

**පෙර පාසල් අවධිය**

මේ අවුරුදු 2-5 අවධිය යි. වැඩීම ළදරු වියේ මෙන් වේගවත් නැත. ස්නායු, ඇට, පේශි පරිනත වේ. කිරිදත් සියල්ල වැඩී ඇත. හොඳින් දිවීම, පැනීම, නැගීම කළ හැකි ය. මොළය වැඩිහිටියකුගේ මෙන් 90% පමණ වේ. ඉන්ද්‍රිය සමායෝජනය ක්‍රමයෙන් සිදු වේ. මේ වර්ධනයට පෝෂණ ව්‍යායාම, විවේකය, නින්ද බලපායි.

බුද්ධි වර්ධනය වේගවත් ය. එයට හේතුව භාෂාව වර්ධනය යි. වාග් කෝෂය වචන 2000ක් පමණ ඇත. කුතුහලයෙන් යුක්ත ය. ඒ බැවින් ප්‍රශ්න කිරීම, නිරීක්‍ෂණ හැකියා ප්‍රදර්ශනය කරයි. ද්‍රව්‍ය හා අත්දැකීම් මත දැනුම ලබා ගනී. මනඃකල්පිත බව වැඩි ය. සංරක්‍ෂණ හැකියා නැත. ආපස්සට සිතිය නොහැකි ය. සංජානනයට වහල් වේ. තර්කන හැකියාව නැත.

චිත්තවේග නිතර වෙනස් වේ. ඒවා පාලනයට ද අපහසු ය. මානසික අවශ්‍යතා ඉටු වීම තුළින් චිත්ත වේග වර්ධනය වේ. දරුවා හදා වඩා ගන්නා ක්‍රමය, පවුලේ සංස්කෘතිය, පරිසරය ඒ කෙරෙහි බලපායි. චිත්ත වේග වශයෙන් වෙහෙස කර අවධිය කි.

මේ අවධියේ පවුල හා සමාජය අතර අන්තර් සම්බන්ධතා දරුවාගේ සමාජයි ය වර්ධනයට හේතු වේ. ඊට සංස්කෘතිය ද එකතු වේ. දෙමාපියන් දක්වන සැලකිල්ල මත සදාචාර සිරිත් විරිත් අනුගමනය කරයි. මිතුරන් හා සුළු වේලාවක් සෙල්ලම් කළ හැකි ය.

**ප්‍රාථමික පාසල් අවධිය (අවුරුදු 5-11)**

වර්ධනය අඛන්ඩ ය. පෙර මෙන් වේගවත් නැත. අත්පාවල වැඩි වර්ධනයක් ඇත. විශේෂයෙන් ම පාවල වර්ධනය වැඩි ය. උස,බර වැඩි ය. ස්නායු, ඇට, පේශි තවදුරටත් වර්ධනය වේ. ශරීරයේ නියම හැඩය ඇති වේ. ඉන්ද්‍රිය සමායෝජනය දියුණු වේ. සියලු මාංශ පේෂී වර්ධනය නිසා සංකීර්ණ චාලක ක්‍රියා කළ හැකි ය. කිරිදත් වැටී ස්ථිර දත් එයි.

සංකල්ප සාධනයට යොමු වෙයි. ඒ සඳහා ඉන්ද්‍රියයන් හා ද්‍රව්‍ය මුල් කර ගත් ක්‍රියාකාරකම් උපයෝගී කර ගනී. සංයුක්ත වස්තු පිළිබඳ ව සංරක්‍ෂණ හැකියාව, ආපස්සට සිතීම වැනි බුද්ධි ලක්‍ෂණ ක්‍රමයෙන් වර්ධනය වේ. තමා ළඟ නැති වියුක්ත දේ ගැන තර්කානුකූල ව සිතිය නො හැකිය. කුතුහලය ඇත.

සැහෙන දුරට චිත්ත වේග පාලනය කළ හැකි ය. අනෙක් වර්ධන අවස්ථාවලට අනුව චිත්තවේගික වශයෙන් සංසුන් අවධිය කි. මානසික අවශ්‍යතා ඉටු වීම මත චිත්තවේගීත තත්වය රඳයි. පාසලේ බලපෑම වැඩි ය. ආදරය, පිළිගැනීම, සුරැකියාව නව අත්දැකීම් ලබයි. තවදුරටත් බලාපොරොත්තු වෙයි. වැඩිහිටි අනුමැතිය අපේක්‍ෂා කරයි. ක්‍රමයෙන් අන්‍යෝන්‍ය ගෞරවයක් වැඩිහිටියන්ගෙන් පතයි. දඬුවම්, තහංචි හොඳ නැත.

පවුල, පාසල, සම වයස් මිතුරන් බලපායි. රුචිකම් මත මිතුරු කණ්ඩායම් ඇති වේ. ඒවා තාවකාලික ය. ගැහැණු පිරිමි වෙන් වෙන් ව කණ්ඩායම් වේ. කණ්ඩායම් තුළින් නායකත්වයට, සාමූහිකත්වයට, සහයෝගයට හුරු වේ. සදාචාරයට ක්‍රමයෙන්  යොමු වේ. පොදු හැඟීම් ස්ථිර කණ්ඩායම් ඇතිවන්නේ ක්‍රමයෙනි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ එකතුවකි...

**ද්විතියික පාසල් අවධිය (අවුරුදු 11-18)**

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම වර්ධනය වේගවත් ය. වැඩ වර්ධනය බාහුවල හා කඳේ ය. උස, බර ශරීර ලක්ෂණ පහල වේ. පිරිමි ළමුන්ට වඩා කල් ඇති ව ගැහැණු ළමයි පරිණතියට පත් වෙයි. ශරීරය වැඩිහිටියකුගේ ස්වභාවයක් ගනී. නිර්ණාල ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය ඇති වේ. ලිංගේන්ද්‍රිය වර්ධනය සීඝ්‍ර කායික වර්ධනය පසු ව ඇති වේ. දෙපක්ෂයට ම වර්ගයා බෝ කිරීමේ හැකියාව ඇත.

සංකල්ප වර්ධනයේ දියුණු අවස්ථාව මෙය යි. වියුක්ත චින්තනය ඇති වේ. කල්පිත ගොඩ නැඟීමේ හැකියාව වර්ධනය වේ. විද්‍යාත්මක ප්‍රශ්න මෙන් ම වියුක්ත හා න්‍යායාත්මක ප්‍රශ්න විසඳිය හැක. නව අර්ථකථන දක්වයි. විද්‍යාව, ගණිතය වැනි විෂයයන්හි මෙන් ම ආගම, දර්ශනය ආදියේ ගැඹුරු සංකල්ප ද තේරුම් ගනී.

වේගවත් ශාරීරික වර්ධනය, කල් පසුව හෝ කල් ඇති ව සිදුවන වර්ධනය මත චිත්තවේගික ගැටළු මතු වේ. නිදහස, පරමාදර්ශ, ලිංගික ලැදියා, සම වයස් වැනි දෑ මත වැඩිහිටියන් හා චිත්තවේගී ගැටුම් ඇති කර ගනී. තම ශාරීරික වෙනස ගැන ලැජ්ජාව, කුතුහලය ඇති කර ගනී. තම තමාගේ රූප ශෝභාව, පෙනුම, පිරිසිදුකම ගැන වඩාත් සැලකිලිමත් යෞවනයා ළමා වියත්, වැඩිහිටි වියත් අතර අතරමංවූ බවක් දැනේ. තව දුරටත් වැඩිහිටි ආරක්ෂාව, ආදරය පත යි.

සම වයස් කණ්ඩායම් ඇසුර බලවත් වේ. විරුද්ධ ලිංගිකයන් හා ඇසුර ප්‍රිය කරයි. ගැහැණු හා පිරිමි එකම කණ්ඩායම වේ. පොදු හැඟීම, පරමාදර්ශී බව, වීරත්වය, තදාත්මීකරණය දක්නට ලැබේ. අන්‍යෝන්‍ය ගරුත්වය අපේක්ෂා කරයි. පවත්නා දුර්වලතා විවේචනය කරයි.

ඇමුණුම 2.7

ක්‍රියාකාරකම

ළමා සංවර්ධනය

ළමා සංවර්ධනයේ පහත සඳහන් අංශ අතුරින් එකක් තෝරා ගන්න.

1. කායික සංවර්ධනය
2. මානසික සංවර්ධනය
3. චිත්ත වේග සංවර්ධනය
4. සමාජ හා සදාචාර සංවර්ධනය

- ඔබ තෝරා ගත් ළමා සංවර්ධන අංශයේ ස්වභාවය
- එම අංශයේ සංවර්ධනයට අදාල වන පරිදි කටයුතු කළ හැකි ආකාර

පිළිබඳ කණ්ඩායම සාකච්ඡා කර වාර්තාවක් ඉදිරිපත් කරන්න.

ඇමුණුම 2.8

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ එකතුව...

විශේෂ අවශ්‍යතා ඇති ළමුන්

1. යොමු ප්‍රශ්න (බුද්ධි කලම්භනය සඳහා)

- ඔබ පන්ති කාමරයේ අවශ්‍යතා ඇති ළමුන් හඳුනා ගෙන තිබේ ද?
- එම විශේෂ අවශ්‍යතා කෙබඳු ආකාර ද?
- ඒ සඳහා යොදා ගත් ප්‍රතිකාර්ය ඉගැන්වීමට ක්‍රම මොනවා ද?
- ඔබේ ප්‍රත්‍යාවේක්ෂණයන් මොනවා ද?
- ඒවා අතර ඔබ ඔබ වඩාත් හොඳයයි සිතන අත්දැකීම් මොනවාද?

ඇමුණුම 2.9

ක්‍රියාකාරකම

- සුහග සිසුන්
- සෙමෙන් ඉගෙන ගන්නා සිසුන්
- අවධානය අඩු සිසුන්
- සමාජ ආක්‍රමණකාරී සිසුන්

- ඉහත සිසුන් වර්ග අතරින් එකක් තෝරා ගන්න.
- පහත සඳහන් ශීර්ෂ යටතේ කණ්ඩායම තුළ සාකච්ඡා කර, අත්දැකීම් ආශ්‍රිත ව වාර්තාවක් ඉදිරිපත් කරන්න.

✓ එම සිසුන්ගේ චර්යාමය ලක්ෂණ
✓ එම ලක්ෂණ හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණ
✓ එ බඳු සිසුන් වෙනුවෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතු ක්‍රියා මාර්ග (ඔබේ අත්දැකීම් නිදසුන් ලෙස ඉදිරිපත් කරන්න.)

ඇමුණුම 2.10

**ළමයා හඳුනා ගැනීම**

විශේෂ අවශ්‍යතා ඇති ළමයි.

අද අධ්‍යාපනය තුලින් පමණක් නොව ලෝක සම්මත අයිතිවාසිකම් වලදී ද ළමයාට වැඩි අවධානයක් දක්වා ඇත. සෑම ආගමක ම දරුවා වස්තුවක් ලෙස හඳුන්වා ඇත. රූසෝ දක්වන්නේ දරුවා වැඩිහිටියාට වඩා වෙනස් බවත් දරුවාගේ නිදහස අගය කළ යුතු බවත් ය. අධ්‍යාපනය ලැබීමට සෑම ළමයාටම අයිතියක් ඇත. ළදරු අවධියේ සිටම දරුවා ඇති දැඩිකිරීම රජයේ ද වගකීමක් ලෙස සලකා අධ්‍යාපනය මෙන් ම සෞඛ්‍ය හා පෝෂණය සැලසීමට සෑම රටක්ම අවධානය යොමුව පවතී. එක්සත් ජාතීන්ගේ සංවිධානය දරුවාගේ සෞඛ්‍යය ආරක්ෂාව හා අධ්‍යාපනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එමෙන් ම දරුවාගේ අනාගතය පෝෂණය කිරීමේ වගකීම ගුරුවරයා වෙත ද දැඩි ව පැටවී ඇති බැවින්



SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

දරුවාගේ ස්වභාවය හඳුනා ගැනීම ගුරු කාරය භාරය ඉටු කර ගැනීමේ දී වැදගත් කමින් යුක්ත ය. දරුවා දෙමව්පියන් ඇසුරේ වැඩෙතත් විවිධ අඩුපාඩු පවතී. විවිධ මාධ්‍ය මෙන් ම සමාජ බලවේග ජන ජීවිතයට ප්‍රබල බලපෑම් එල්ල කර ඇති අතර ඒවාට ළමයා ගොදුරු වන්නේ නොදැනුවත්ව ය. මෙවැනි පරිසරයක දරුවා ගැන අවබෝධයෙන් ගුරු කාර්යය සාර්ථක කරගත හැකි ය.

ළමා සංවර්ධනය කායික මානසික චිත්තවේගීය වාලක ඉන්ද්‍රියමය බුද්ධිමය සමාජමය හා පෞද්ගලික යන විවිධ අංශ වලින් සංවර්ධනය වන අතර සෑම ළමයෙකුට ම අධ්‍යාපනය ලැබීමේ අයිතියක් ඇත. ඔවුන්ගේ විවිධතා හා ඌනතා හමුවේ පිළියම් යෙදීමේ වගකීම ද හිමිවන්නේ පාසලට යි. එ බැවින් කිසිම දරුවකු පාසලට නොගැලපේ යැයි ප්‍රතික්ෂේප කිරීමේ අයිතියක් හෝ හැකියාවක් කිසිවකුට නැත. එනිසා දරුවා භාර ගෙන යහපත් පුද්ගලයකු බවට පත් කිරීමේ භාර දූර වගකීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

විශේෂ අවශ්‍යතා ඇති සිසුන්

කායික මානසික චිත්තවේගීය වශයෙන් ප්‍රදර්ශනය වන වෙනස්කම් තුලින් දරුවා ඉගෙනුම් කාර්ය සඵල කර ගන්නේ අඩු පාඩු සහිතව ය. පන්ති කාමරයේ බහුල ව දක්නට ලැබෙනුයේ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ය. අනෙකුත් සාමාන්‍ය ළමයින්ට වඩා වෙනස් විශේෂ ගැටළු හා සාමාර්ථතා ඇති ළමයා මේ ගණයට වැටේ. මානසික අබාධිත බිහිරි අර්ධ බිහිරි අන්ධ අංග විකල ශාරීරික ආබාධිත වෙනස් අයුරින් ශරීර අවයව පිහිටි මෙන් ම ඉගෙනුමට පසුබට හෙමින් ඉගෙන ගන්නා සහ ඉගෙනුමට නො හැකියා සහිත ළමුන් පන්ති කාමරයේ පහසුවෙන් හඳුනා ගත හැකි ය. එහෙත් සියලු ම ළමයින්ට පොදු ව අවශ්‍යතා මෙන් ම ඔවුනට ම පොදු වූ සුවිශේෂතා හා අවශ්‍යතා ඇති බවට අද වන විට පිළිගැනීමට අනුව සෑම ළමයෙක් ම විශේෂ අවශ්‍යතා සහිත ළමුන් ලෙස සැලකේ.

ඒ අනුව ළමයාට ම සුවිශේෂ වූ ගති ලක්‍ෂණ ජන්මයෙන් මෙන් ම වෙනත් සමාජීය බාහිර හේතු මත දරුවා තුල ඇති අවශ්‍යතා ද විවිධ බව පෙනී යන බැවින් එම එක් එක් ළමයාට වෙන් වූ උපාය මාර්ග යොදා ගැනීම ගුරුවරයා විසින් ම කළ යුතු ය.

ළමුන්ගේ වයස පෙනුම ශරීර වර්ධනය සමාන මට්ටමේ වුවු ද හැකියා දක්‍ෂතා කුසලතා වැනි ලක්‍ෂණ අන් අයට වඩා කැපී පෙනෙන දක්‍ෂ සිසුන් සුභග සිසුන් ලෙස දක්වන අතර ඔවුන්ගේ බුද්ධි ඵලය ඉහල මට්ටමක පවතී. පාසලෙන් පිට ජාතික මට්ටමට පවා ඉහළ ප්‍රාප්ති මට්ටමක් දක්වන්නේ මෙම සිසුන් ය. මොවුන් එම හැකියා ශක්තිය ජන්මයෙන් ම ලබා ගත් දක්‍ෂතාවය කි. විශේෂ වූ ඉගෙනුම් අවස්ථා අවශ්‍යා නො වූව ද ඔවුන්ගේ විභව්‍යතා පවත්වා ගැනීමට උපකාර වීම ගුරුවරයාට හිමි වන වගකීමකි. එසේ නොමැති වුවොත් අතෘප්තිය හීන වූ ඉච්චාභංගත්වයට පත් ඒ ළමයාගේ අධ්‍යාපනයට හානි කර තත්වයට පත් වේ. එබැවින් දක්‍ෂතා අනුව සෑම දරුවාට ම විශේෂ වූ අවධානයක් ලබා දීම ගුරුවරයාගේ කාර්ය භාරය වේ.

සුභග ළමුන් හඳුනා ගැනීමේ සරල ක්‍රමයක් ලෙස නිරීක්‍ෂණ තුලින් ගන්නා නිගමන වලට එලඹීම විද්‍යාත්මක ප්‍රායෝගික සාධාරන ව පිළිගත හැකි ක්‍රමයක් ලෙස සැලකිය නො හැක. එමෙන් ම බුද්ධි ඵලය මැනීම පමණක් ප්‍රමාණවත් නො වන බැවින් මානසික ශක්තීන් අවධානයට යොමු කර ඇත. නිර්මාණාත්මක හැකියා හා බුද්ධිමය හැකියා ද අමතර ව මැනීමට අද අවධානය යොමු ව ඇත. භාෂාව ගණිතය විද්‍යාව වැනි විෂය ප්‍රවීනතාව මෙන් ම නිර්මාණකරණයට ඇති හැකියාව ද බාහිර ක්‍රියාකාරකම් වලදී ද සහජ දක්‍ෂතා ඇති සිසුන් මේ ගණයට වැටේ. එයට අමතර ව සාධනය පන්ති මට්ටමට ඉහළ හෝ පහළ මට්ටමේ දී ඒ අතරමැදි පන්ති මට්ටමට ගැලපෙන සිසුන් ද හඳුනා ඉගැන් වීම සාර්ථක කරලීම ගුරුවරයාගේ කාර්යභාරයට අයත් තව පැත්තකි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

සෙමෙන් ඉගෙන ගන්නා සිසුන් සඳහා ගුරුවරයා ප්‍රතිකාර්ය ඉගැන්වීම් සැලසුම් කර ගත යුතු ය. ගණිත සංකල්ප සාධනයේ ඌනතා, නිරන්තර ව අඩු ලකුණු ලබා ගැනීම, ධාරන ශක්තිය අඩු වීම, අත්දැකීම් මන්දගාමී ව ලබා ගැනීම, සමාජය සමඟ වන අන්තර් සම්බන්ධතා අඩු වීම, පසුබට තාවය, සහභාගිත්වය අඩු වීම ශාරීරික අභ්‍යාසයනට හෝ වෙනත් නිර්මාණාත්මක හැකියා ප්‍රදර්ශනය නො වීම දක්නට ඇත.

සාමාන්‍ය පන්තිකාමරයක චර්යා අක්‍රමතා ඇති සිසුන් ද වෙති. ආක්‍රමණකාරී, විනාශකාරී, අකීකරු, මුරණ්ඩු ගති ඇති, නිතර වැරදි කරන අය මේ ගණයට වැටේ. මේ අය නිතර දඬුවම් ද ලබති. මේ අයගේ හැසිරීම් පාලනය කිරීමට නිතර නිතර නීති රීති මතක් කර දීමට සිදු වේ. සමහර සිසුන් සමාජ ආක්‍රමණ කාරී ගති පෙන්වති. මොවුහු සොරකම් කිරීම, කලබල කිරීමට පෙළඹෙති.

අවධානය දැක්වීමට නොහැකි ළමුන් ද චර්යා අක්‍රමතා ඇති ළමයින් ගණයට වැටේ. අවධානය අඩුකම නිතර අපිළිවෙලට සිටීම, ආරම්භක ශක්තිය අඩුවීම අපිරිසිදු බව මේ අයගේ ලක්ෂණ වේ. චර්ධන අක්‍රමතාවලට හේතු වනුයේ ආරමය සාධක උපතට පෙර හා උපතින් පසු හැදුනු වැඩුනු පරිසරය දැඩි කාංසාව අදිය යි.

මෙම සිසුන් විවිධතා අනුව ඒ අයගේ සුවිශේෂතා අනුව ඉගෙනුම් ක්‍රියාවලිය සැකසීම, ආදරය හා කරුණාව ලබාදීම, පන්තියේ සියලු දෙනාට ම සමාන ව සැලකීම හා ඔවුන්ගේ හැකියා උපරිම තලයකට ගෙන ඒම ගුරුවරයාගේ වගකිම යි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ළමයාගේ පෞද්ගලික සුවිශේෂතා හඳුනා ගෙන තනි පුද්ගල ඉගෙනුම් ප්‍රවේශ මඟින් ඉගෙනුම පුද්ගලික බවට පත් කිරීම වර්තමානයේ පිළිගත් ඵලදායී ක්‍රමය යි.

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමග එක්වන්න...